# මහා සභා රැස්වීම් වාර්තාව

# 2022.06.09

## පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2022.06.09 වන දින පැවැත්වෙන මාසික මහා සභා රැස්වීම් වාර්තාව.**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මාසික මහා සභා රැස්වීම 2022 ජූනි මස 09 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

ඒ සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සහභාගී විය.

| | | | |
|---|---|---|---|
| 02. | ගරු උපසභාපති | - | ඩී.වී.උපාලි මැතිතුමා. |
| 03. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.ප්‍රේමදාස මැතිතුමා. |
| 04. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා. |
| 05. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා. |
| 06. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමා. |
| 07. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.වී.ආරියරත්න මැතිතුමා. |
| 08. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | කේ.ඒ.ලක්මිණී දසනායක මැතිතුමිය. |
| 09. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.එස්.දීප්ති ධර්ම ශ්‍රී මැතිතුමා. |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.එම්.උපාලි ජයරත්න මැතිතුමා. |
| 11. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.බිමල්ක ප්‍රමෝද්‍යා මැතිතුමා. |
| 12. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.වී.අජිත් නිශාන්ත මැතිතුමා. |
| 13. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඒ.එම්.හේමන්ත පෙරේරා මැතිතුමා. |
| 14. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.ඒ.ඉන්දික මැතිතුමා. |
| 15. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ජේ.ආර්.ශ්‍රියාලතා මැතිතුමිය. |
| 16. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා. |
| 17. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එල්.සුමිත් කුමාර මැතිතුමා. |
| 18. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එන්.වී.සමන් පුෂ්ප කුමාර මැතිතුමා. |
| 19. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඊ.චන්දිම ධර්මප්‍රිය ඇලපාත මැතිතුමා. |
| 20. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා. |
| 21. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා. |
| 22. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | මංජුල ඩයස් වික්‍රමනායක මැතිතුමා. |
| 23. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.පියසේන මැතිතුමා. |
| 24. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.චමින්ද ගුණරත්න මැතිතුමා. |
| 25. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ.චින්තක දේශප්‍රිය සුරවීර මැතිතුමා. |
| 26. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ටී.රිද්මා අනුරුද්ධිකා ධර්මවර්ධන මැතිතුමිය |
| 27. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | වයි.ආර්.පුෂ්පා ප්‍රියදර්ශනී ගුණසේකර මැතිතුමිය. |
| 28. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සෙල්වනායගම් රගවන් මැතිතුමා. |
| 29. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ජී.අනෝමා ප්‍රියදර්ශනී ගාල්ලගේ මැතිතුමිය. |
| 30. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ඩී.පුෂ්පලතා වැලිකල මැතිතුමිය. |
| 31. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | කේ.ටී.මෝහන්දාස් මැතිතුමිය. |
| 32. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා. |
| 33. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.ඉන්දික කුමාර දිසානායක මැතිතුමා. |
| 34. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා. |
| 35. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එල්.එස්.දයාල් චමින්ද කුමාර මැතිතුමා. |
| 36. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | රාජරත්නම් පුවනේස්වරී මැතිතුමිය. |

පැමිණ සිටි සියලු දෙනාම ආගම සිහි කර , රණවිරුවන් සිහිකිරීමෙන් පසුව ගරු සභාපතිතුමන් විසින් අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු උප සභාපතිතුමා , ගරු විපක්ෂනායකතුමා ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා ද, ලේකම්තුමා හා නිලධාරීතුමිය ද පිළිගැනීමෙන් අනතුරුව සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**01. පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම. ( 2022.05.19)**

2022.05.19 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සලකා සංශෝධන ඇතොත් ඉදිරිපත් කිරීමටත් , සංශෝධන නොමැති නම් එම වාර්තාව සභා සම්මත කිරීමටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වයි.ආර්.පුෂ්පා ප්‍රියදර්ශනී ගුණසේකර මැතිතුමිය 2022.05.19 දින සභාවට පැමිණි නමුත් අතපසුවීමකින් පැමිණීමේ ලේඛනයෙහි අත්සන යෙදීමට නොහැකි වී ඇති බවත් ය.එනිසා නිවාඩු අවලංගු කිරීම සුදුසු බවට එතුමා පවසන ලදී.

ඒ අනුව එම සංශෝධනය යටත්ව 2022.05.19 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමන් විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එල්.සුමිත් කුමාර මැතිතුමන් විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

**02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදනය.**

**01.** 2023 වර්ෂයට අදාලව වාර්ෂික අයවැය ලේඛනය සැකසීමේ යෝජනා ලබා ගැනීම හා ඊට සමගාමීව අංක 03/2022 දරණ ජාතික අයවැය චක්‍රලේඛයේ රාජ්‍ය වියදම් පාලනය කිරීම සම්බන්ධව සඳහන් කර ඇති උපදෙස් පිළිබඳව සභාව දැනුවත් කිරීම.

**02.** එම චක්‍රලේඛයේ (xi) වගන්තියෙන් රාජ්‍ය ආයතන අතර සන්නිවේදන කටයුතු සඳහා හැකිතාක් විද්‍යුත් ක්‍රමවේද භාවිතා කිරීම මගින් ලිපිද්‍රව්‍ය භාවිතය හා මුද්‍රණ කටයුතු සඳහා වන පිරිවැය අවම කර ගන්නා ලෙසත් , සබරගමුව පළාත් පාලන කොමසාරිස්ගේ CLG/DE/03/01 අංක දරණ 2022.05.30 දිනැති ලිපියෙන් පළාත් පාලන ආයතන වල සහ එම බල ප්‍රදේශවල අඩු වියදම් කළමනාකරණයක් යටතේ සිදු කළ හැකි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යටතේ මුද්‍රණ යන්ත්‍ර හා කඩදාසි වල මිල අධික ලෙස ඉහළ යාම හා ද්‍රව්‍යවල හිඟය හේතුවෙන් ලිපි ශීර්ෂ, ලිපි, වාර්තා (සභා වාර්තා) මුද්‍රණය කිරීමේදී ඉතා අත්‍යවශ්‍ය අවස්ථාවල අවශ්‍ය කරුණු සඳහා පමණක් අරපිරිමැස්මෙන් මුද්‍රණ කටයුතු සිදු කරන ලෙසත් දන්වා ඇත.ඒ අනුව සභා වාර්තා ආදිය විද්‍යුත් මාධ්‍ය ක්‍රමවේදයක් වන වට්ස්ඇප් මාර්ගයෙන් ගරු මන්ත්‍රීවරුන්ට යොමු කිරීම සුදුසු බව සඳහන් කරමි.

අදහස් දක්වමින් ගරු විපක්ෂනායකතුමා පවසා සිටියේ තාක්ෂණයට හුරු විය යුතු බැවින් ඒ ක්‍රම පරිහරණය කිරීම සුදුසු බව ය.

සභා වාර්තා උසාවියට වුව ද ඉදිරිපත් කළ හැකි වටිනා ලේඛනයක් බවත් , මසකට වරක් එවන මෙම සභා වාර්තා අවශ්‍ය මොහොතක දී ප්‍රයෝජනයට ගැනීම සඳහා එකතු කර තබා ගන්නා බවත් , විපක්ෂයේ දෙදෙනෙකුට හා ආණ්ඩු පක්ෂයේ දෙදෙනෙකුට වශයෙන් සභා වාර්තා ලබා දීම සුදුසු බවත් ගරු උප සභාපතිතුමා පවසන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටියේ සභා වාර්තා වට්ස් ඇප් මාර්ගයෙන් එවීමෙන් පරිශීලනය කිරීමේ අපහසුවක් පැන නගින බව ය.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ කඩදාසි හිඟයක් පවතින බවත් , ඒ සඳහා මුහුණ දීමට සිදු වන බවත් ය.තව ද යම්කිසි මන්ත්‍රීවරයෙකු අපහසුතාවයට පත් වන්නේ නම් එම මන්ත්‍රීවරයාට සභා වාර්තා මුද්‍රණය කර ලබා දීමට කටයුතු කරන බවත් , ඒ වෙනුවෙන් බැදී සිටින බවත් , සභා වාර්තා මුද්‍රණ පිටපත් අවශ්‍ය මන්ත්‍රීවරුන් ඒ පිළිබඳව දැනුවත් කරන ලෙසත් , වට්ස් ඇප් මාර්ගයෙන් සභා වාර්තා ලබා ගැනීමට කැමැත්ත පළ කරන මන්ත්‍රීවරුන් ඔබ වෙත ලැබෙන කොළයෙහි නම හා වට්ස් ඇප් අංකය සටහන් කරන ලෙසත් ය.

**03.** **සභාව අමතා එවන සංදේශ, මහජන පෙත්සම්/පැමිණිලි සභාව ඉදිරියේ තැබීම.**

**04.** **යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත.**

**05.** **යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**I. <u>ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ යෝජනා.</u>**

**01.** පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ගෙවිය යුතු හිඟ විශ්‍රාම වැටුප් දායක මුදල් 2022.03.31 දිනට හිඟ ශේෂය රු.3,174,655.01කි.මෙම හිඟ මුදල ගෙවා අවසන් කරන ලෙස විගණන විමසුම්වලින් හා කාර්යාල පරීක්ෂණ වාර්තාවලින් දන්වා ඇති බැවින් මෙම හිඟය කොටස් වශයෙන් හෝ ගෙවීමට සිදු වී ඇත. ඒ සම්බන්ධව සුදුසු තීරණයක් ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 01</u>**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ගෙවිය යුතු හිඟ විශ්‍රාම වැටුප් දායක මුදල් 2022.03.31 දිනට හිඟ ශේෂය රු.3,174,655.01 ක් වන නමුත් වත්මන් අවධියේ සභාවට ලැබෙන ආදායම අඩු වීම හා එම මුදල ගෙවීමට තරම් සභාවේ පවතින මුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් එක් මාසයක දී මාස හතරකට අදාල හිඟ විශ්‍රාම වැටුප් දායක මුදල් ලෙස ගෙන කොටස් වශයෙන් ගෙවා හිඟ විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවා අවසන් කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**02.** මේ දිනවල දෛනිකව සිදුවන විදුලි කප්පාදුව හේතුවෙන් විවිධ අවශ්‍යතා සඳහා පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය වෙත පැමිණෙන මහජනතාව හා කාර්යාලයේ නිලධාරී මණ්ඩලය අපහසුතාවයට පත්වීම නිසා අපහසුතාවයන් මඟහරවා ගැනීම සඳහා පෙර අවස්ථාවේදී පැල්මඩුල්ල ආදාහනාගාරයට මිලදී ගත් විදුලි ජනන යන්ත්‍රයට අදාල පිරිවිතරයන්ට අනුකූලව පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයට නව විදුලි ජනන යන්ත්‍රයක් මිල දී ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 02</u>**

මේ දිනවල දෛනිකව සිදුවන විදුලි කප්පාදුව හේතුවෙන් විවිධ අවශ්‍යතා සඳහා පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය වෙත පැමිණෙන මහජනතාව හා කාර්යාලයේ නිලධාරී මණ්ඩලය අපහසුතාවයට පත්වීම හේතුවෙන් අපහසුතාවයන් මඟහරවා ගැනීම සඳහා පෙර අවස්ථාවේදී පැල්මඩුල්ල ආදාහනාගාරයට මිලදී ගත් විදුලි ජනන යන්ත්‍රයට අදාල පිරිවිතරයන්ට අනුකූලව පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයට නව විදුලි ජනන යන්ත්‍රයක් මිල දී ගැනීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය

**03.** රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ අංක RT/311/RO/2019 සහ 2021/01/04 දිනැති ලිපියට අනුව 2019 පැවැත්වූ විරෝධතා පරීක්ෂණ වල දී රත්නපුර පාර වම 1225/4 යන වරිපනම් අංක දරණ තේ කර්මාන්ත ශාලාව වසා දමා ඇති බවත් , කර්මාන්ත ශාලාව වසා ඇති කාලසීමාව සඳහා ප්‍රාදේශීය සභා පනතට අනුව කටයුතු කිරීම සුදුසු බවත් දන්වා ඇත. ඒ අනුව ප්‍රාදේශීය සභා පනතේ 145 (1) වගන්තියට අනුව 2021.12.09 දිනැති මහ සභාවේදී තීරණ අංක 13 යටතේ තීරණයක් ලබා ගත් අතර, නිවැසිභාවය නොමැති ගොඩනැගිල්ලක් යටතට මෙම ගොඩනැගිල්ල අයත් නොවීම නිසා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව තීරණයක ලබා ගන්නා ලෙස සහකාර පළාත් පාලන කොමසාරිස්තුමා යොමු කර ඇති ලිපියෙන් දන්වා ඇත. ඒ අනුව, සුදුසු තීරණයක් ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

**<u>1987 අංක දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය</u>**

**" යම් තැනැත්තකුගෙන් ප්‍රාදේශීය සභාවකට අය විය යුතු යම් මුදල් ප්‍රමාණයක් සම්පූර්ණයෙන්ම හෝ ඉන් යම් කොටසක් හෝ එම මුදල් ප්‍රමාණයේ නොවැදගත්කම හෝ එය අය කර ගැනීමට නොහැකි වීම හෝ එම තැනැත්තාගේ දුප්පත්කම යන හේතුව මත යෝජනා සම්මතයක් මගින් ප්‍රාදේශීය සභාවක් විසින් අත් හරිනු ලැබිය හැකිය. රුපියල් පනහක් ඉක්මවන මුදලක් අත් හැර දැමීමට අදාළ යෝජනා සම්මතයක් අමාත්‍යවරයාගේ අනුමැතියට යටත් විය යුතුය."**

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**සටහන 01 -**

| වරිපනම් අංකය | වාර්ෂික වටිනාකම | 2019 , 2020 ,2021 වර්ෂ සඳහා අය විය යුතු මුදල | 2019 , 2020 , 2021 වර්ෂ සඳහා අය විය යුතු මුදලින් 50 % |
|---|---|---|---|
| 1225/4 | රු.193,477.68 | රු.580,433.04 | රු.290,216.52 |

**<u>තීරණ අංක 03</u>**

රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ අංක RT/311/RO/2019 සහ 2021/01/04 දිනැති ලිපියට අනුව 2019 වර්ෂයේ පැවැත්වූ විරෝධතා පරීක්ෂණ වල දී රත්නපුර පාර වම 1225/4 යන වරිපනම් අංක දරණ තේ කර්මාන්ත ශාලාව වසා දමා ඇති බව හා කර්මාන්ත ශාලාව වසා ඇති කාලසීමාව සඳහා ප්‍රාදේශීය සභා පනතට අනුව කටයුතු කිරීම සුදුසු බවත් දන්වා ඇති බැවින් , අදාල තේ කර්මාන්ත ශාලාවේ කළමනාකරුගේ ඉල්ලීමට අනුව ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය හා ආදායම් පරීක්ෂකතුමියගේ වාර්තාව ද සලකා බලා 2019 , 2020 , 2021 වර්ෂ සඳහා අයවිය යුතු මුදල වන රු.580,433.04 න් 50 % ක මුදල වන රු.290,216.52 ක් පමණක් කපා හැරීම සුදුසු බවටත් ඉතිරි රු.290,216.52 ක මුදල අය කර ගැනීම සුදුසු බවටත් කළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**04.** පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ හිඟ වරිපනම් බදු නොගෙවීම සම්බන්ධව 2021/12/31 දිනට හිඟ ඒකක 2662 ක් ඇති අතර රු.5000.00 ට වැඩි ඒකක 230 ක් ඇත.ප්‍රාදේශීය සභා පනතේ 158 (1) වගන්තිය ප්‍රකාරව එම දේපල හිමියන්ට රතු නිවේදන නිකුත් කිරීම හා දේපල තහනම් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දක්වමින් ගරු උපසභාපතිතුමා පවසා සිටියේ සභාවට ආදායමක් ලබා ගැනිමට මෙය හොඳ වැඩක් වුව ද , වර්තමානයේ ජනයා පත්ව සිටින දැඩි ආර්ථික දුෂ්කරතාවය මත මෙම දේපල හිමියන්ට රතු නිවේදන නිකුත් කිරීම හා දේපල තහනම් කිරීම සිදු නොකළ යුතු බවත් , ඉදිරියේ දී මෙම තීරණය සම්බන්ධව තීරණයක් ලබා ගැනීම සුදුසු බවත් ය.

ගරු සභාව එසේ තීරණය කරනවා නම් ඉදිරියේ දී මෙම යෝජනාව සම්බන්ධව තීරණයක් ලබා ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**<u>තීරණ අංක 04</u>**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රාදේශය තුළ හිඟ වරිපනම් බදු නොගෙවීම සම්බන්ධව 2021/12/31 දිනට හිඟ ඒකක 2662 ක් හා රු.5000.00 ට වැඩි ඒකක 230 ක් ඇති අතර ප්‍රාදේශීය සභා පනතේ 158 (1) වගන්තිය ප්‍රකාරව කටයුතු කිරීමට ඇත.නමුත් වර්තමානයේ ජනයා පත්ව සිටින දැඩි ආර්ථික දුෂ්කරතාවය මත මෙම දේපල හිමියන්ට ප්‍රාදේශීය සභා පනතේ 158 (1) වගන්තිය ප්‍රකාරව රතු නිවේදන නිකුත් කිරීම හා දේපල තහනම් කිරීම සිදු නොකළ යුතු බවත් , ඉදිරියේ දී මෙම යෝජනාව සම්බන්ධව තීරණයක් ලබා ගැනීම සුදුසු බවටත් ඒකමතිකව සභා සම්මත විය

**05.** 2022.05.19 වන දින පැවැති මහ සභාවේ තීරණ අංක 03 යටතේ මාළු කඩ කාමර ටෙන්ඩරය පිළිවෙලින් ඊළඟට සිටින ටෙන්ඩර්කරුවන්ට ලබා දීමට කටයුතු සිදු කළ නමුත් එම ටෙන්ඩර්කරුවන් මාළු කඩ කාමර ටෙන්ඩරය භාර ගැනීම ප්‍රතික්ෂේප කරන ලදී. ඒ හේතුවෙන් මාළු කඩ කාමර ටෙන්ඩරය සම්බන්ධව සුදුසු තීරණයක් ගැනීමට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු උපසභාපතිතුමා පවසා සිටියේ මෙම කඩ කාමරය මාළු හා කුකුල් මස් කඩ කාමරය ලෙස ටෙන්ඩර් කළහොත් විශාල ඉල්ලුමක් ඇති බවත් , ආදායම හදා ගත හැකි බවත් ය.

**<u>තීරණ අංක 05</u>**

2022.05.19 වන දින පැවැති මහ සභාවේ තිරණ අංක 03 යටතේ පැල්මඩුල්ල පොදු වෙළෙඳපොල අංක 14 දරණ මාළු කඩ කාමර ටෙන්ඩරය පිළිවෙලින් ඊළඟට සිටින ටෙන්ඩර්කරුවන්ට ලබා දීමට කටයුතු සිදු කළ නමුත් එම ටෙන්ඩර්කරුවන් මාළු කඩ කාමර ටෙන්ඩරය භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කර ලබා දුන් රු.300,000.00 ක අවම ලංසු මුදලට අනුව නැවත ලංසු කැඳවීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**06.**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ අනතුරුදායක ගස් හා පරිසර බලපත්‍ර අලුත් කිරීමේ අයදුම්පත්‍ර පරීක්ෂා කිරීම සඳහා මේ වන තෙක් ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තුවක් අය නොකරයි. එය පරීක්ෂා කිරීමට ක්ෂේත්‍ර නිලධාරියෙකු අදාල ස්ථානයට යාමේදී දැනට රටෙහි පවතින ඉන්ධන අර්බුදය සහ ඉන්ධන සඳහා වැඩි මුදලක් වැය වන හෙයින් දැනට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් ලබා ගන්නා පරීක්ෂණ ගාස්තු ප්‍රමාණවත් නොවන හෙයින් ස්ථාන පරීක්ෂාව සඳහා 1km සඳහා රු.10.00 මුදල බැගින් අය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු උප සභාපතිතුමා පවසා සිටියේ ක්ෂේත්‍ර නිලධාරීන්ට ගමන් ගාස්තුවක් ගෙවන්නේ නැද්ද යන්නය .

ඊට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ ලබා දෙන ගමන් ගාස්තු ප්‍රමාණවත් නොවන බවත් , වත්මන් අවධියේ පෙට්‍රල් මිල ඉහළ යාම නිසා මෝටර් බයිසිකලයකින් අලුපොත , නිරල්ගම වැනි ස්ථාන වලට ස්ථාන පරීක්ෂාවකට ගොස් නැවත සභාවට පැමිණීමේ දී 70km ක් පමණ ඇති නිසා විශාල මුදලක් වැය වන බවත් , මෙම 06 හා 07 යන යෝජනා වල දී ස්ථාන පරීක්ෂාව සඳහා 1km සඳහා රු.10.00 බැගින් අය කිරීම සාධාරණ බවත් , අඩු ආදායම්ලාභී පුද්ගලයෙකුට මෙම ගාස්තුව ගෙවීමට නොහැකි නම් ඒ සඳහා සහනයක් ලබා දීමට කටයුතු කිරීම සුදුසු බවත් ය.

__තීරණ අංක 06__

මේ සම්බන්ධව නීත්‍යානුකූල තත්වය පළාත් සභාවෙන් විමසා පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් බල ප්‍රදේශය තුළ ඇති අනතුරුදායක ගස් හා පරිසර බලපත්‍ර අලුත් කිරීමේ අයදුම්පත්‍ර පරීක්ෂා කිරීම සඳහා මේ වන තෙක් ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තුවක් අය නොකිරීම හා ක්ෂේත්‍ර නිලධාරියෙකු අදාල ස්ථානයට යාමේදී දැනට රටෙහි පවතින ඉන්ධන අර්බුදය සහ ඉන්ධන සඳහා වැඩි මුදලක් වැය වීම හේතුවෙන් ස්ථාන පරීක්ෂාව සඳහා 1km සඳහා රු.10.00 මුදල බැගින් අය කිරීම සුදුසු බවටත් , මේ සම්බන්ධව නීත්‍යානුකූලව ගැටලුක් ඇති වුවහොත් පමණක් පෙර පැවති ක්‍රමවේදයටම ස්ථාන පරීක්ෂණ ගාස්තුවක් අය නොකර ඒ සතියට අදාල පරීක්ෂා කිරීම් සතියේ එක් දිනයක් යොදා ගෙන එදින සිදු කිරීම සුදුසු බවටත් ඒකමතිකව සභා සම්මත විය.

**07.** පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජල නල එලීම සඳහා මාර්ග පළුදු කිරීමේදී එය පරීක්ෂා කිරීමට ක්ෂේත්‍ර නිලධාරියෙකු අදාල ස්ථානයට යාමේදී දැනට රටෙහි පවතින ඉන්ධන අර්බුදය සහ ඉන්ධන සඳහා වැඩි මුදලක් වැය වන හෙයින් දැනට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් ලබා ගන්නා පරීක්ෂණ ගාස්තු ප්‍රමාණවත් නොවන හෙයින් ක්ෂේත්‍ර පරීක්ෂාව සඳහා 1km සඳහා රු.10.00 මුදල බැගින් අය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

__තීරණ අංක 07__

මේ සම්බන්ධව නීත්‍යානුකූල තත්වය පළාත් සභාවෙන් විමසා පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් බල ප්‍රදේශය තුළ ජල නල එලීම සඳහා මාර්ග පළුදු කිරීමේදී ලබා ගන්නා පරීක්ෂණ ගාස්තු ප්‍රමාණවත් නොවීම හා ක්ෂේත්‍ර නිලධාරියෙකු අදාල ස්ථානයට යාමේදී දැනට රටෙහි පවතින ඉන්ධන අර්බුදය සහ ඉන්ධන සඳහා වැඩි මුදලක් වැය වීම හේතුවෙන් ස්ථාන පරීක්ෂාව සඳහා 1km සඳහා රු.10.00 මුදල බැගින් අය කිරීම සුදුසු බවටත් , මේ සම්බන්ධව නීත්‍යානුකූලව ගැටලුක් ඇති වුවහොත් පමණක් පෙර පැවති ක්‍රමවේදයටම පරීක්ෂණ ගාස්තු අය කිරීම හා ක්ෂේත්‍ර නිලධාරියා විසින් ඒ සතියට අදාල පරීක්ෂා කිරීම් සතියේ එක් දිනයක් යොදා ගෙන එදින සිදු කිරීම සුදුසු බවටත් ඒකමතිකව සභා සම්මත විය.

**08.** 2022.04.07 මාසික මහා සභා රැස්වීමේ තීරණ අංක 08 පරිදි පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් ගල්ලෙපිට ආදාහනාගාරයේ ගාස්තු බල ප්‍රදේශය තුළ රු.10,000.00 ලෙසත් , බල ප්‍රදේශයෙන් පිටත රු.12,000.00 ලෙසත් තීරණය කර ඇත.වත්මන් අවධිය වන විට ගෑස් වල මිල තව දුරටත් ඉහළ ගොස් ඇති බැවින් උක්ත මුදලට අදාලව ආදාහන සිදු කළ නොහැකි බැවින් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් ගල්ලෙපිට ආදාහනාගාරයේ ගාස්තු බල ප්‍රදේශය තුළ රු.12,000.00 ලෙසත් බල ප්‍රදේශයෙන් පිටත රු.15,000.00 ලෙසත් මුදල් සංශෝධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු විපක්ෂනායකතුමා පවසා සිටියේ ගෑස් වල මිල සමඟ සංසන්දනය කිරීමේ දී ආදාහනාගාරයේ ගාස්තු සංශෝධනය විය යුතු නමුත් මහජන නියෝජිතයන් ලෙස මිල වැඩි නොකර ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතු බවත් , විටින් විට සෑම භාණ්ඩයක ම මිල වැඩි වන බවත් , මේ අවස්ථාවේ දී දුක් විඳින ජනතාවට ඇහුන්කන් දී ඔවුන්ට සහන සැලසිය යුතු බවත් , මෙම අදූරදර්ශී පාලකයන්ව ගෙදර යැවිය යුතු බවත් , නැතිනම් මේවාට විසඳුමක් නොමැති බවත් , කළමනාකරණය කර ආදායම් සොයා ගත හැකි ස්ථාන වලින් ආදායම් රැස් කර ගත යුතු බවත් නමුත් ආදාහනාගාරයේ ගාස්තු වැඩි නොකළ යුතු බවත් ය.

මිනී පෙට්ටි සෑදීමට විශාල මුදලක් වැය වන නිසා මිනී පෙට්ටි වල මිල වැඩි වී ඇති බවත් , ගෑස් වල මිල වැඩි වීම නිසා ආදාහනාගාරයේ මිල වැඩි වී ඇති බවත් , ගෙවීම් වාර්තාව සලකා බැලීමේ දී මාසෙකට ලක්ෂ දෙකකට ආසන්නව සභාපතිතුමාගේ වාහනයට තෙල් ගසා ඇති බවටත් අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටියේ මෙහි දී මිනිසුන්ගෙ වියදම් වැඩි නොකර අපේ වියදම් අඩු කර ගැනීමට කටයුතු කළ යුතු බවත් ය. අකාර්යක්ෂම පාලනය හේතුවෙන් රටම අගාදයට වැටී ඇති බවත් , පොඩි ආයතනයෙන් ආරම්භ වී ඉහළටම නාස්තිය හා දූෂණය ඇති බවත් , රාජ්‍ය කළමනාකරණය පාලනයක් දැක්මක් ආදර්ශයක් ඇතිව කළ යුතු බවත් , ආදාහනාගාරයේ මිල වැඩි කිරීම සම්බන්ධව විරුද්ධත්වය ප්‍රකාශ කරන බවත් ඔහු පවසන ලදී.

ඒ සම්බන්ධව අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ අනිත් ආදාහනාගාර වල ගාස්තු හා සංසන්දනය කිරීමේ දී අප සභාවෙන් ලබා ගන්නා ගාස්තු අඩු බව ය.වර්තමානයේ ඩීසල් මිල වැඩි වීම මත වෙනදා ලබා ගත් ඩීසල් ප්‍රමාණයම ලබා ගැනීමට වුව ද විශාල මුදලක් වැය වන බවත් , පවතින ඩීසල් මිල සමඟ ඩීසල් කොපමණ ලබා ගත්තා ද යන්න බලා ගත හැකි බවත් , කිසි දිනක අනුමත ඩීසල් ප්‍රමාණය ඉක්මවා පරිභෝජනය කර නොමැති බවත් , ගෙවීම් වාර්තාව පිළිබඳව සාකච්ඡා කරන අවස්ථාවේ ඒ සම්බන්ධව අදහස් ඉදිරිපත් කරන ලෙසත් , සභාවේ වියදම් හැකි පමණින් අඩු කර ගැනීමට කටයුතු කර ඇති බවත් අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටින ලදී.

**තීරණ අංක 08**

වත්මන් අවධිය වන විට ගෑස් වල මිල තව දුරටත් ඉහළ ගොස් ඇති බැවින් පැවති මුදලට අදාලව ආදාහන සිදු කළ නොහැකි බැවින් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් ගල්ලෙපිට ආදාහනාගාරයේ ගාස්තු බල ප්‍රදේශය තුළ රු.12,000.00 ලෙසත් බල ප්‍රදේශයෙන් පිටත රු.15,000.00 ලෙසත් මුදල් සංශෝධනය කිරීමට ඉදිරිපත් වූ යෝජනාව සභා සම්මත විය

**09.** හල්පාවල, අතපත්තුව, අළුබෝගහහේන හරහා ඉහලගේවත්ත පාර සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ ගිවිසුම් ගත මුළු ඇස්තමේන්තු මුදලටම ගිවිසුම් ගත වී ඇති අතර මුළු ඇස්තමේන්තු මුදලටම ව්‍යාපෘතිය සිදු කර ඇත.ගෙවීම් කිරීමේ දී වැඩ වටිනාකම ඉක්මවා සිදු කර ඇති රු.30,000.00 ක මුදල සඳහා 2022 පෙබරවාරි මස අධීක්ෂණ වාර්තාව මඟින් ලබා දෙන ලද නිර්දේශයට අනුව සකස් කරන ලද අතිරේක ඇස්තමේන්තුව ( වටිනාකම රු.32,664.55 ) සහා අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 09**

හල්පාවල, අතපත්තුව, අළුබෝගහහේන හරහා ඉහලගේවත්ත පාර සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ ගිවිසුම් ගත මුළු ඇස්තමේන්තු මුදලටම ගිවිසුම් ගත වී ඇති අතර මුළු ඇස්තමේන්තු මුදලටම ව්‍යාපෘතිය සිදු කර ඇති බැවින් ගෙවීම් කිරීමේ දී වැඩ වටිනාකම ඉක්මවා සිදු කර ඇති රු.30,000.00 ක මුදල සඳහා 2022 පෙබරවාරි මස අධීක්ෂණ වාර්තාව මඟින් ලබා දෙන ලද නිර්දේශයට අනුව සකස් කරන ලද අතිරේක ඇස්තමේන්තුව ( වටිනාකම රු.32,664.55 ) සඳහා සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**10.** පොල්ගස්තැන්න, මැද පාර සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ ගිවිසුම් ගත මුළු ඇස්තමේන්තු මුදලටම ගිවිසුම් ගත වී ඇති අතර මුළු ඇස්තමේන්තු මුදලටම ව්‍යාපෘතිය සිදු කර ඇත.ගෙවීම් කිරීමේදී වැඩ වටිනාකම ඉක්මවා සිදු කර ඇති රු.3,885.90 ක මුදල සඳහා විගණන විමසුම් වාර්තාව මගින් පෙන්වා දී ඇති පරිදි සකස් කරන ලද අතිරේක ඇස්තමේන්තුව හා වැඩ වටිනාකම ඉක්මවා සිදු කර ඇති මුදල ගෙවීම වෙනුවෙන් අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 10**

පොල්ගස්තැන්න, මැද පාර සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ ගිවිසුම් ගත මුළු ඇස්තමේන්තු මුදලටම ගිවිසුම් ගත වී ඇති අතර මුළු ඇස්තමේන්තු මුදලටම ව්‍යාපෘතිය සිදු කර ඇති බැවින් ගෙවීම් කිරීමේදී වැඩ වටිනාකම ඉක්මවා සිදු කර ඇති රු.3,885.90 ක මුදල සඳහා විගණන විමසුම් වාර්තාව මගින් පෙන්වා දී ඇති පරිදි සකස් කරන ලද අතිරේක ඇස්තමේන්තුව හා වැඩ වටිනාකම ඉක්මවා සිදු කර ඇති මුදල ගෙවීම වෙනුවෙන් අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය

**11.** 2022.01.13 දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ තීරණ අංක 21 යටතේ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ආයතන වල ආරක්ෂාව තහවුරු කර ගැනීම හා පාලන කටයුතු පහසු කර ගැනීම සඳහා ප්‍රධාන කාර්යාලය , කෙටේතැන්න කසළ කළමනාකරණ මධ්‍යස්ථානය , ගල්ලෙපිට ආදාහනාගාරය හා පැල්මඩුල්ල සතිපොළ යන ස්ථාන සඳහා කඩිනමින් මිල ගණන් කැඳවා ආවේශන (සී.සී.ටී.වී) කැමරා පද්ධති පිහිටුවීම සුදුසු බවට ඉදිරිපත් වූ තීරණය හදිසි යෝජනා යටතේ ඉදිරිපත් කර ඇති බවත්, හදිසි යෝජනා ලෙස ඉදිරිපත් කළ යුතු නොවන බවත්, එය නිවැරදිව යථා පරිදි කල් දී ඇති යෝජනා ලෙස න්‍යාය පත්‍රයට ඇතුළත් කර සභා සම්මුතියක් ලබා ගැනීම වඩා සුදුසු බවත් සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් උපදෙස් දී ඇත. ඒ අනුව තීරණයක් ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙම යෝජනාව පසුව සිදු කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසන ලදී.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ තාවකාලිකව අනියුක්ත කළ අය මෙන්ම රැකියා ලක්ෂයෙන් පැමිණි ආරක්ෂක නිලධාරීන් සිටිය ද ඔවුන් සභාවට ලොකුවට බැඳීමක් නොමැති බවත් , අපට සේවකයෙක් බඳවා ගැනීමට අවස්ථාවක් නොමැති බවත් , සභාවේ යම් යම් ප්‍රශ්න ඇති වුන තැන් තිබෙන බැවින් එහි දී සාක්ෂි සහිතව ඔප්පු කර ගැනීමට හා සභාවේ දේපල ආරක්ෂා කර ගැනීමට සී.සී.ටී.වී.කැමරා සවි කළ යුතු බව ය.

මේ සම්බන්ධව අදහස් දක්වමින් ගරු උප සභාපතිතුමා හා විපක්ෂනායකතුමා පවසා සිටියේ මෙම යෝජනාව තව තවත් කල් දැමීමෙන් තව දුරටත් මිල ගණන් ඉහළ යා හැකි බැවින් , හොඳ තැනකින් සී .සී.ටී.වී.කැමරා මිල දී ගැනීම සුදුසු බව ය.

**තීරණ අංක 11**

2022.01.13 දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ තීරණ අංක 21 යටතේ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ආයතන වල ආරක්ෂාව තහවුරු කර ගැනීම හා පාලන කටයුතු පහසු කර ගැනීම සඳහා ප්‍රධාන කාර්යාලය , කෙටේතැන්න කසළ කළමනාකරණ මධ්‍යස්ථානය , ගල්ලෙපිට ආදාහනාගාරය හා පැල්මඩුල්ල සතිපොළ යන ස්ථාන සඳහා කඩිනමින් මිල ගණන් කැඳවා ආවේශන (සී.සී.ටී.වී) කැමරා පද්ධති පිහිටුවීම සුදුසු බවට ඉදිරිපත් වූ තීරණය හදිසි යෝජනා යටතේ ඉදිරිපත් කර ඇති බවත්, හදිසි යෝජනා ලෙස ඉදිරිපත් කළ යුතු නොවන බවත්, එය නිවැරදිව යථා පරිදි කල් දී ඇති යෝජනා ලෙස න්‍යාය පත්‍රයට ඇතුළත් කර සභා සම්මුතියක් ලබා ගැනීම වඩා සුදුසු බවත් සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් උපදෙස් දී තිබීම හේතුවෙන් නැවත යථා පරිදි කල් දී ඇති යෝජනා සඳහා ඉදිරිපත් කළ මෙම යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**II. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ. සුමේධ ලක්මාල් මැතිතුමාගේ යෝජනා.**

**01.** බැරැණ්ඩුව කොට්ඨාසය ඇතුලු පැල්මඩුල්ල බල ප්‍රදේශයේ ම ජනයා අතර වත්මන් අවධියේ බොහෝ ලෙස නීතිවිරෝධී ලෙස මත්කුඩු හා මත්ද්‍රව්‍ය පරිහරණය කිරීම නිසා විවිධ ගැටලු ඇති වී ඇති අතර ඒවා වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ. සුමේධ ලක්මාල් මැතිතුමා ප්‍රකාශ කළ සිටියේ මෙය විශාල අර්බුදයක් බවත් , කතාවට පමණක් සීමා නොවී අදාල බලධාරීන් දැනුවත් කර මේ සඳහා කඩිනමින් වැඩපිළිවෙලක් සකස් කළ යුතු බවත් , මත්කුඩු පරිහරණය කරන්නන් ඒවා මිලට ගැනීම සඳහා මුදල් සොයා ගැනීමට සොරකමට ද පුරුදු වී ඇති බවත් , සභාවක් ලෙස මෙම ක්‍රියා නතර කිරීමට උත්සාහ කළ යුතු බවත් , තමන්ට තිබෙන දේවල් පරිස්සම් කර ගැනීමට මිනිස්සු මහන්සි වන බවත් , මෙය සෑම ප්‍රදේශයක ම පවතින ප්‍රශ්නයක් බවත් , මත්කඩු පරිහරණයට තරුණයින් විශාල ලෙස පෙළඹීම නිසා ඔවුන්ගේ ජීවිත විනාශ වන බවත් , තම වසමේ කුඩු පරිහරණය නොකරන අය සොයා ගැනීමට බැරි තරම් බවත් ය.

එක් අවස්ථාවක දී මත්කුඩු නාශක අංශය විසින් මත්කුඩු අල්ලා පසුව නැවත වෙළෙඳපොළට ඒවා විකුණා තිබූ බවත් , මෙවන් තත්වයක් රට තුළ පවතින බවත් , එනිසා මේවා නවත්තන්නට අවංක උත්සාහයක් රට තුළ තිබෙනවා ද යන්න සැකයක් මතු වන බවත් , මේ සඳහා නිලධාරීන් , පොලීසිය , හමුදාව , දේශපාලනඥයො ආදී සියලු දෙනාම සම්බන්ධ බවත් , කුඩු තිබෙන බවට තොරතුරක් පොලීසියට ලබා දුන්නහොත් එය අපේ ජීවිතයට තර්ජනයක් වන බවත් , දෙමාපියන්ද මේවාට ඇබ්බැහි වූ දරුවන් මේවායින් ගලවා ගැනීමට තම සේසතම විකුණා කටයුතු කරන බවත් , අපරාධ හා ඇලපාත සිද්ධියට ද මත්ද්‍රව්‍ය මුල් වූ බවත් , මේවා සම්බන්ධව පුළුල් විධිමත් වැඩපිළිවෙලක් අවශ්‍ය බවත් , මේවාට ඇබ්බැහි වීමට හේතුව කුමක් ද යන්න සොයා බැලිය යුතු බවත් අදහස් දක්වමින් ගරු විපක්ෂනායක ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටින ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ මෙම යෝජනාව කාලීන යෝජනාවක් බවත් , සියලු දෙනා ම මේ සම්බන්ධව දේශපාලනඥයින්ට ඇඟිල්ල දිගු කරන බවත් , දේශපාලනඥයො යනු ජනතාවගේ නියෝජිතයන් බවත් , රිල්හේනෙන් ආරම්භ කළ පසු නිවසට යන තෙක් ම තමන්ට ලැබෙන මන්ත්‍රී දීමනාව විවිධ රෝගාබාධ ඇති පුද්ගලයින්ට , දැඩි ආර්ථික දුෂ්කරතාවයෙන් පෙළෙන අයට ලබා දීමට කටයුතු කරන බවත් , රත්නපුරේ සිදු වන විශාල මත්කුඩු ව්‍යාපාරයක් සම්බන්ධව තමන් පොලීසියට තොරතුරු ලබා දුන් බවත් , නමුත් ඒ සඳහා ක්‍රියාමාර්ගයක් නොගත් බවත් , එවැනි අවස්ථා වල දී දේශපාලනඥයින් වැරදි නැති බවත් , නිලධාරීන් සිදු කරන වැරදි සඟවා ගැනීමට සෑම මොහොතක දී ම දේශපාලනඥයින්ට ඇඟිල්ල දිගු කරන බවත් , තමන් සම්බන්ධීකරණ කමිටුවේ දී කසිප්පු පෙරන ස්ථානයක් පිළිබඳව කළ ප්‍රකාශය සම්බන්ධව තමන් එම ස්ථානයෙන් පිටවීමට පෙර ම එම කසිප්පු පෙරන පුදගලයින් දුරකථනයෙන් තමාගෙන් විමසූ බවත් , කුඩු ව්‍යාපාරය ලෙල්ලොපිටිය , ගෝණකුඹුර , වැලිමළුව , බැරැණ්ඩුව ආදී සෑම ප්‍රදේශයකම පවතින බවත් , තවත් අවස්ථාවක දී මත්ද්‍රව්‍ය විකුණපු පුද්ගලයෙක් පොලීසියෙන් අල්ලා පැය 3ක් යෑමටත් පෙර නිදහස් කර ඇති බවත් , පක්ෂයන් අතහැර දමා පවුරක් ලෙස සියලු දෙනා ම මෙය වළක්වා ලීමට උදවු කළ යුතු බවත් , මේ සම්බන්ධව ප්‍රාදේශීය සභාවක් වශයෙන් විශාල දෙයක් කළ නොහැකි මුත් විධිමත් වැඩපිළිවෙලක් සකස් කරන ලෙස ඉහළට යොමු කළ යුතු බව ය.

කාලෝචිත යෝජනාවක් බවත් , කුඩු වැඩිපුරම පවතින ප්‍රදේශයේ තමන් ජීවත් වන බවත් , ප්‍රධාන ව්‍යාපාරය එතනින් මෙහෙයවන බවත් , මත්ද්‍රව්‍ය නිසා ගමේ විවිධ ප්‍රශ්න ඇති වන බවත් , සමහර අවස්ථා වල දී පොලීසිය නිසා මෙය පාලනය කළ නොහැකි බවත් , මත්කුඩු සම්බන්ධව තොරතුරු ලබා දුන් පසුව තොරතුරු ලබා දුන් බවට එම අදාල පිරිස් දැන ගන්නා බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එස්.දයාල් චමින්ද කුමාර මැතිතුමා පවසන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ මෙවැනි අවස්ථා වල දී බොහෝ නිලධාරීන් වැරදි ආකාරයට කටයුතු කරන මුත් නිවැරදිව රාජකාරි කරන අය සිටින බවත් , එක් අවස්ථාවක දී තමන් සමඟ රාජකාරි කටයුතු කරන ග්‍රාම නිලධාරිවරයා විසින් කසිප්පු අල්ලා ඒ සම්බන්ධව පොලීසියට දැනුම් දී පොලීසිය පැමිණෙන තුරු කසිප්පු බැරලය තම කාර්යාලය අසල තබා රාජකාරි කටයුතු කළ බවත් , එතුමාගේ බයිසිකලයේ යතුර එතුමා ළඟ තිබුන අතර යම් කිසි පුද්ගලයෙක් නිවසට කතා කර අනෙක් යතුර නිවසින් ගෙන්වා ගෙන එතුමාගේ බයිසිකලය රැගෙන ගොස් ඇති බවත් , ඉන් පසුව පොලීසිය ද කසිප්පු බැරලය සහ එම පුද්ගලයාව රැගෙන යාමට පැමිණ තිබුනේ බයිසිකලයෙන් බවත් , ඒ අනුව පොලීසියේ රාජකාරි කිරීම සම්බන්ධව පැහැදිලි වන බවත් , කොටකෙතන ගමෙහි විශාල ලෙස අපරාධ සිදු වූවේ මත්ද්‍රව්‍ය නිසා බවත් , පාලනය හොඳ නිසා සමහර රට වල මත්ද්‍රව්‍ය නොමැති බවත් , මත්කුඩු සම්බන්ධව අවධානය යොමු කර විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ යුතු බවත් , අත්අඩංගුවට පමණක් නොගෙන පුනරුත්තාපනය කිරීමට හෝ ආදී වශයෙන් සුදුසු වැඩපිළිවෙලක් සකස් කළ යුතු බවත් ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා විසින් අදහස් දක්වමින් පවසා සිටියේ තමා ද පොලීසියේ රාජකාරි කටයුතු කළ බවත් , කුඩු ව්‍යාපාරය සම්පූර්ණයෙන් ම නැවැත්විය හැකි බවත් , කුඩු ව්‍යාපාරය කරන තැනැත්තන්ට පොලීසිය ගැහුවොත් ඒ මිනිස්සු මානව හිමිකම් යන බවත් රට තුළ එසේ තත්වයක් නිර්මාණය වී ඇති බවත් , පොලිස් නිලධාරීන් දඩුවම් කරන්නේ තමන්ගේ දේවල් ආරක්ෂා කර නොගැනීමට බවත් එතුමා පවසන ලදී.

පාලනයකින් , විනයකින් තොරව පොලිස් නිලධාරීන් , රජයේ නිලධාරීන් දූෂිත ආකාරයට මුදල් සොයන ක්‍රමයක් හා ව්‍යාපාරයක් බවට මතුකුඩු ව්‍යාපාරය පත්වී ඇති බවත් , මත්කුඩු පැල්මඩුල්ල පුරාම ජනයා පරිහරණය කිරීමට පුරුදුව ඇති බවත් , මේවා නතර කිරීමට ප්‍රාදේශීය සභාවේ සභාපති ලෙස හා රටෙහි පුරවැසියෙක් ලෙසත් පුද්ගලිකව අනන්ත අප්‍රමාණව මැදිහත් වී කටයුතු කළ බවත් , නමුත් කිසිම නිලධාරියෙක් සාධාරණය ඉෂ්ට නොකළ බවත් , දරුවන්ගේ අනාගතය සඳහා වෙනත් රටකට යාම මෙම අවස්ථාවේ සුදුසු බවට හැගෙන බවත් , පාර්ලිමේන්තුවේ බොහෝ අයට මත්කුඩු නැවැත්වීමට අවශ්‍ය වුව ද පොලිස් නිලධාරීන් මේවා නතර කිරීමට කටයුතු නොකරන බවත් , ඒ සම්බන්ධව හදවත් තුළ වේදනාවක් ඇති බවත් , අපරාධ සිද්ධියටත් මුල් වූවේ මත්කුඩු බවත් , සභාවේ වැඩ කටයුත්තක් ලෙස සිවිල් සංවිධාන වල , ව්‍යාපාරයන්ගේ , මාධ්‍යවේදීන්ගේ උදවු ඇතිව ගරු බෝධානන්ද හිමියන් ද සම්බන්ධ කර ගනිමින් වසම් වල සිටින පාසල දරුවන්ව සම්බන්ධ කරමින් දැනුවත් කිරීමේ වැඩපිළිවෙලක් සකස් කළ යුතු බවත් , එය ඵලදායී වන බවත් , මේ යෝජනාව සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ගරු ජනාධිපතිතුමා , ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති , පොලිස්පති , මූලස්ථාන පරීක්ෂක රත්නපුර , පැල්මඩුල්ල ස්ථානාධිපතිතුමා ඇතුළු අදාල නිලධාරීන්ගෙන් ඉල්ලා ලිපි යොමු කිරීම සුදුසු බවටත් ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටින ලදී.

**තීරණ අංක 12**

වත්මන් අවධියේ පැල්මඩුල්ල බල ප්‍රදේශයේ පාසල් දරුවන් බොහෝ ලෙස නීතිවිරෝධී මත්කුඩු හා මත්ද්‍රව්‍ය පරිහරණය කිරීම හේතුවෙන් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව , ව්‍යාපාරිකයින් හා සිවිල් සංවිධාන එකතු වී පූජ්‍ය කුප්පියාවත්තේ බෝධානන්ද හිමි හා වසම් මට්ටමින් පාසල් දරුවන් සම්බන්ධ කර ගනිමින් ඒවායින් වැළකීමට අවශ්‍ය උපදෙස් ලබා දීමේ වැඩසටහනක් සංවිධානය කිරීමටත් , මේ යෝජනාව සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ගරු ජනාධිපතිතුමා , ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති , පොලිස්පති , මූලස්ථාන පරීක්ෂක රත්නපුර , පැල්මඩුල්ල ස්ථානාධිපතිතුමා ඇතුළු අදාල නිලධාරීන්ගෙන් ඉල්ලා ලිපි යොමු කිරීම සුදුසු බවටත් ඒකමතිකව සභා සම්මත විය.

**හදිසි යෝජනා**

**ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ යෝජනා.**

01. පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් ණය පදනම මත ඉන්ධන ලබා ගැනීම සඳහා රු.ලක්ෂ දෙකක (රු.200,000.00) මුදලක් බලංගොඩ පාර , පැල්මඩුල්ල , සීමාසහිත පැල්මඩුල්ල විවිධ සේවා සමුපකාර සමිතියේ තැන්පත් කිරීමට අනුමැතිය ලබා දීමට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ අත්‍යවශ්‍ය සේවා සපයන වාහන සඳහා ඉන්ධන ලබා ගැනීමට සමුපකාර සමිතියට රුපියල් ලක්ෂ දෙකක තැන්පතුවක් තැන්පත් කළ විට එම සීමාවට යටත්ව ඉන්ධන ලබා ගැනීමට හැකි බවත් ය.

**තීරණ අංක 13**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් ණය පදනම මත ඉන්ධන ලබා ගැනීම සඳහා රු.ලක්ෂ දෙකක (රු.200,000.00) මුදලක් බලංගොඩ පාර , පැල්මඩුල්ල , සීමාසහිත පැල්මඩුල්ල විවිධ සේවා සමුපකාර සමිතියේ තැන්පත් කිරීමට අනුමැතිය ලබා දීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06. කාරක වාර්ථා සලකා බැලීම - 2022-05-19 දින පැවති මුදල් කමිටු රැස්වීම් වාර්තාව අනුමත කිරීම.**

ඒ අනුව 2022-05-19 දින පැවති මුදල් කමිටු රැස්වීම් වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එල්.සුමිත් කුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**07. 2022-05-01 සිට 2022-05-31 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව අනුමත කිරීම හා ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගිති වාර්තාව සලකා බැලීම.**

ගෙවීම් වාර්තාව සම්බන්ධයෙන් අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටියේ සභාවේ වාහන සඳහා ඉන්දන පරිභෝජනය කිරීම පාලනය කළ යුතු බව ය.

ඊට අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ සභාවේ ඉන්දන භාවිතා කිරීම හැකි පමණින් අඩු කර ඇති බව ය.

ගෙවීම් වාර්තාවෙහි රිල්හේන වත්තෙහි ක්‍රීඩා පිටියට ගෙවීමක් සිදු කර ඇති බවත් , එම ස්ථානයෙහි පස් ගොඩැලි ඇති බවත් , එම ස්ථානය නාය අවධානමට ලක් වූ ස්ථානයක් බවත් එනිසා එන්.බී.ආර්.ඕ.රිපෝට් එක ලබා ගත්තා ද යන්න ගරු විපක්ෂනායකතුමා විමසන ලදී.

ඊට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ එන්.බී.ආර්.ඕ.රිපෝට් එක ලබා ගෙන මෙම කටයුතු සිදු කළ බව ය.

2022-05-01 සිට 2022-05-31 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව අනුමත කිරීම හා ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගිති වාර්තාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**08. වෙනත් කරුණු.**

- **සභාව දැනුවත් කිරීමේ නිවේදන හා අදහස් දැක්වීම්.**

**ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමා**

මාධ්‍යවේදී යූ.ඒ.අයි.වීරවර්ධන මහතා ඉදිරිපත් කළ ලිපිය සභාවට ඉදිරිපත් කරමින් පළාත් පාලන මැතිවරණයට අදාල දිවයිනේ දිස්ත්‍රික් මට්ටමින් කැෆේ සංවිධානයේ මඟපෙන්වීම යටතේ ECDIC ආයතනයේ සම්බන්ධීකරණයෙන් සිදු කෙරෙන වැඩපිළිවලෙහි රත්නපුර දිස්ත්‍රික්කයේ දෙවන වැඩමුළුව මේ මස 2022.06.16 වන සිකුරාදා පෙ.ව.9.00 සිට ප.ව.2.00 දක්වා රත්නපුර ඓතිහාසික සබරගමුව මහ සමන් දේවාල දිව්‍යප්‍රසාදිනී ශාලාවේ දී පැවැත්වීමට සැලසුම් කර ඇති බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**ගරු උප සභාපති ඩී.වී.උපාලි මැතිතුමා**

මෙම ආණ්ඩුවේ කළමනාකරණයෙහි යම් යම් දෝෂ තිබිය හැකි මුත් පිටරට තෙල් වල මිල ඉහළ යන විට ශ්‍රී ලංකාවෙත් මිල වැඩි කිරීමට සිදු වන බවත් , තමන් ද සොරකමට විරුද්ධ බවත් , හොඳ පාලනයකට කැමති බවත් , මෙම පාලනයේ ඇති යම් යම් වැරදි වලට තමන් ද විරුද්ධ බවත් , විදුලි බල මණ්ඩලයෙහි වෘත්තීය සමිති , ප්‍රවාහන , සෞඛ්‍ය ආදී ක්ෂේත්‍රයන්හි සිදු කරන වැඩ වර්ජන හේතුවෙන් පීඩාවට පත් වන්නේ ජනතාව බවත් , රටේ ඇති ප්‍රශ්න වලට විසඳුමක් අවශ්‍ය බවත් , මේ අවස්ථාවේ ආණ්ඩුවේ මාරුවක් අවශ්‍ය නොවන බවත් , මෙවැනි අසීරු ආර්ථික තත්වයක් රට තුළ පවතිද්දීත් සහල් හංගා ජනතාව අපහසුතාවයට පත් කළ සියලු ව්‍යාපාරිකයන්ට අප්‍රසාදය පළ කරන බවත් , රට තුළ මිල පාලනයක් අවශ්‍ය බවත් , අලුතෙන් පත් වූ නායකයන් යමක් කරයි කියා බලාපොරොත්තු වන බවත් අදහස් දක්වමින් ගරු උප සභාපතිතුමා පවසන ලදී.

**ගරු විපක්ෂනායක ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා**

ඇමතිවරයා අත්තනෝමතික ලෙස ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ටෙන්ඩර් දීමට යාම නිසා විදුලි බල මණ්ඩලයේ වෘත්තී සමිති විසින් වැඩ වර්ජනයකට ගොස් ඇති බවත් , ප්‍රසම්පාදන ක්‍රියාවලියකට යා යුතු බවට එම පිරිස ඉල්ලන බවත් ,

මන්ත්‍රීවරුන්ට අවශ්‍ය ආකාරයට පාලනය පවත්වා ගෙන යාම නිසා රට මෙවැනි තත්වයකට පත් වී ඇති බවත් , භාණ්ඩ වල මිල විශාල ලෙස ඉහළ ගොස් ඇති බවත් , ඉදිකිරීමේ ක්ෂේත්‍රය පහතටම වැටී ඇති බවත් , මෙවැනි ආණ්ඩුවක් රටකට අවශ්‍ය නොවන බවත් , රට ඉදිරියට ගෙන යාමට හැකි කෙනෙක් මේ රට භාර ගත යුතු බවත් අදහස් දක්වමින් ගරු විපක්ෂනායකතුමා පවසන ලදී.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල ඩයස් වික්‍රමනායක මැතිතුමා</u>**

2022 මැයි 9 වෙනි දින රට තුළ අයහපත් දේශපාලන , සමාජ , ආර්ථික තත්වයක් පැවති බවත් , දේශපාලන කටයුතු වල දී විපක්ෂය විසින් සෑම අවස්ථාවක දී ම ආණ්ඩුවට විරුද්ධ වීම එදා සිට සිදු වූ බවත් , පාලකයෝ , පාලිතයො , වෘත්තිය සමිති හා සමාගම් ආදී සියලු දෙනාම මෙම රට මෙම තත්වයට ඇද දමා ඇති බවත් , මෙය අවබෝධ කර ගත හැකි නම් මෙම තත්වය මෙතනින් නවතා දැමිය හැකි බවත් , සියලු ම දේශපාලනඥයින් ඉවත් කළ මුත් රට භාර ගත හැකි පුද්ගලයෙක් රටෙහි නොමැති බවත් , සියලු දෙනාම පාලනය පිළිබඳව විවේචනය කරමින් සිටින බවත් , අපේ රට සියලු දෙනා එක්ව ගොඩනැගිය යුතු බවත් , සහල් වල මිල විටින් විට වෙනස් වන බවත් , ව්‍යාපාර පහතට වැටී ඇති බවත් , මිනිසුන්ට ජීවත් වීමට කුලී වැඩ නොමැති වී ඇති බවත් , දේශපාලනයෙන් තොරව රටක් වශයෙන් කැප කිරීම් කර ඉදිරියට යා යුතු බවත් , සභා වාර්තා ලබා දීමේ දී වට්ස් ඇප් මාධ්‍ය භාවිතා කිරීම අවස්ථානුකූලව සුදුසු බවත් , රාජ්‍ය සේවකයො අසීමිත ලෙස බඳවා ගෙන ඇති බවත් , ඉදිරිය පිළිබඳව අවධානයෙන් වැඩ කළ යුතු බවත් , අද සිට ප්‍රාදේශීය සභාවේ සිටින තුරා ම ලබා දෙන මන්ත්‍රී දීමනාව ලබා නොගෙන යහපත් දෙයකට යෙදවීමට තමන් කැමති බවත් , ලැබුන අවස්ථාවේ දී පැල්මඩුල්ලෙහි ප්‍රශ්න විසඳීමට කටයුතු කළ යුතු බවත් , හැකි පමණින් සභාවේ වියදම් සීමා කළ යුතු බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල ඩයස් වික්‍රමනායක මැතිතුමා පවසන ලදී.

ඊට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ සභාවේ වියදම් හැකි උපරිමයෙන් ම සීමා කර ඇති බව ය.

- **පසුගිය සභාවේ ලබා ගත් තීරණ සම්බන්ධයෙන් ප්‍රගිතිය සාකච්ඡා කිරීම.**

2022.05.19 දින මහා සභාවේ තීරණ අංක 06 ට අනුව යූ.එම්.එන්.ජේ.උඩහගෙදර යන අයගේ ජීවිත හා දේපලට අයතුරුදායක පොල් ගස් හතර පිළිබඳව 2022.06.07 දින ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කර ලබා දුන් වාර්තාවට අනුව තැඹිලි ගස කපා ඉවත් කිරීමටත් , ඉතිරි ගස් තුනෙහි අනතුරුදායක ලෙස නිවස දෙසට ඇති ගෙඩි හා අතු සියල්ල ඉවත් කිරීමට හා ගස් තුන ඇද බැදීමට දින 07ක් ලබා දී ඇති බවත් , අදියර වශයෙන් මාස 03ක් අතුලත සම්පූර්ණයෙන් ම අනතුරුදායක බව ඉවත් වී ගස් තුන ඇද බැඳ තිබිය යුතු බවත් , එසේ නොවුනහොත් එම ගස් තුන ද ඉවත් කිරීමට තීරණය කළ බවත් , අනතුර ඉවත් කරන තෙක් ගස් වලින් සිදුවන ජීවිත හා දේපල පිළිබඳ සියලු වගකීම් ගස් හිමිකරුවන් භාර ගත් බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

- **නිවාඩු අනුමත කිරීම.**

අසනීප තත්ත්වය හේතුවෙන් සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ඇති ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ජී.හිරන්ති චතුරංගනී ගමගේ මැතිතුමියට හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමාහට නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.ආර්.ශ්‍රියාලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

- **මීළඟ සභාව පැවැත්වෙන දිනය තීරණය කිරීම.**

මහා සභාව 2022 ජූලි 14 වන දින පැවැත්වීමට තීරණය විය.

- **සභාපතිතුමාගේ ස්තුති කතාව.**

අද දින සභාවට පැමිණ සිටින ගරු උපසභාපති තුමන්, විපක්ෂනායකතුමන් ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රී තුමන්ලාට හා මන්ත්‍රී තුමියන්ලාටත් , ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් , මාධ්‍යවේදී මහතාටත් ස්තුතිය පුද කරමින් ගරු සභාපතිතුමාගේ ස්තුති කතාව අවසන් කරන ලදී.

**පෙ.ව. 11.30 ට පමණ සභාවේ කටයුතු අවසන් විය.**

වාර්තා ගත කලේ

2022-06-30 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදී ය.

ලේකම්
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

ප්‍රාදේශීය සභා .................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා ....................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ ස්ථිරත්වයෙන් සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

2022-07-14 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදී ය.

සභාපති
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව